සංහිඳියාව සඳහා වන වර්තමාන ප්‍රයත්නයන් සම්බන්ධයෙන් ශ්‍රී ලාංකික ජනතාවට ලබා දෙන මාගේ පණිවිඩය

Motoo NOGUCHI (Japan) [i]
2017. 10. 31

මම ජපන් රජයේ නිළ දූත මෙහෙවරක් සඳහා මෙරටට පැමිණ සිටින නමුත් පහත දැක්වෙන මාගේ පණිවිඩය වර්තමාන තත්වය පිළිබඳ මාගේ තාවකාලික නිරීක්ෂණ විදහා දැක්වෙන මාගේ පුද්ගලික අදහසක් වන අතර එමගින් ජපන් රජයේ අදහස් හා ආකල්ප පිළිබිඹු නොවේ.

සංහිඳියා යාන්ත්‍රණ සඳහා වන වර්තමාන ප්‍රයත්නයන් සමස්ථ ශ්‍රී ලාංකික ජනතාව සඳහා වන බවත් ඒ තුළින් ඔවුන් සියල්ලන්ට ම එක හා සමානව ප්‍රතිලාභ හිමි වන බවත් හඳුනා ගැනීම ඉතා වැදගත් වේ. මෙම යාන්ත්‍රණ මගින් ශ්‍රී ලංකාවේ එක් කොටසකට පමණක්, එනම් දමිළ ජනතාවට ප්‍රතිලාභ හිමි වන බවට වැරදි වැටහීමක් තිබිය හැකි වුවත් එය එසේ නොවේ. මෙම ප්‍රයත්නයන්ගේ අසමසම ස්වභාවයට අමතරව සංක්‍රාන්ති යුක්තිය හා වගවීම වැනි ආසියාතික ජනතාවට නුපුරුදු ඇතැම් විදේශීය වචන හේතුවෙන් ද මෙම වැරදි වැටහීම ඇති වී තිබෙන්නට පුළුවන. සැබවින්ම මෙම වචන ජපන් භාෂාව තුළ ද දැකිය නොහැකි අතර තවමත් මෙම වචනවලට සමාන ස්වභාවික පරිවර්තනයන් සොයමින් පවතියි. එබැවින් මෙම වචන භාවිතා නොකර සංහිඳියාව පිළිබඳ මාගේ දැනීම පරිදි පැහැදිලි කිරීමට උත්සාහ ගනිමි.

20වන සියවසේ අගභාගයේ දී ශ්‍රී ලංකාව ප්‍රචණ්ඩත්වයෙන් හා යුද්ධයෙන් පීඩිත අවධියකට පිවිසි අතර එය අවසාන වූයේ 2009 දීය. එතැන් පටන් ශ්‍රී ලංකා රජය හා ජනතාව ඒකීය, සාමකාමී හා සෞභාග්‍යමත් රටක් යළි ගොඩනැගීම සඳහා අවධානය යොමු කරමින් සිටිති. දශක ගණනාවක් තුළ පැවති ප්‍රචණ්ඩත්වය හා යුද්ධය හේතුවෙන් වාර්ගික හෝ ආගම් භේදයකින් තොරව බොහෝ දෙනෙක් පීඩාවට පත් වූහ. සැබවින්ම මෙම කාලය තුළ සමස්ථ රටම දැඩි පීඩාවකට පත් විය. නමුත් එම බේදනීය කාල පරිච්ඡේදය අවසන් වී ඔබ යළිත් ඔබේ රට ගොඩනගමින් සිටියි.

එහි මූලික පියවරක් ලෙස ආර්ථික සංවර්ධනය ළඟා කර ගැනීම සඳහා නිරන්තර උත්සාහය සමග කරුණු කිහිපයක් ප්‍රමුඛතාගත කර ගත යුතුව ඇත. පළමුව තවමත් අතුරුදන්ව සිටින පුද්ගලයන්ගේ ඉරණම හා ඔවුන් සිටින ස්ථාන පිළිබඳ සොයාගෙන ඒ පිළිබඳ ඔවුන්ගේ පවුල් වෙත නොපමාව දැන්විය යුතුය. දෙවනුව,

දැඩි ලෙස පීඩාවට පත් වූවන් සඳහා ප්‍රමාණවත් පරිදි වන්දි ලබා දී ඔවුන්ගේ ගරුත්වය නැවත ලබා ගැනීමට සහාය දිය යුතු අතර නව දිවියක් ආරම්භ කිරීමට හැකි පරිසරය ඇති කළ යුතුය. තෙවනුව, මෙම දැඩි පීඩාවන් ඇති කිරීමට වගකිව යුත්තන්ට නීතියට අනුව හා විශ්වසනීය සාක්ෂි මත පදනම්ව දඬුවම් ලබා දිය යුතුය. සිව්වනුව, සාමකාමී හා සෞභාග්‍යමත් රටක් යළි ගොඩනැගීම හා සිදු වූ බේදවාචකයන් යළි ඇති නොවීම සඳහා රට පුරා සිටින සියළු ම ප්‍රජාවන් එක් විය යුතුය.

ඉහත අරමුණු ළඟා කර ගැනීම සඳහා සංහිඳියා යාන්ත්‍රණ කුළුණු හතරක් මත ගොඩනැගී ඇත: සත්‍යය, යුක්තිය, හානිපූර්ණය හා යළි ඇති නොවීම. රට යළි ගොඩනැගීමටත් ඒකීය සහ සාමකාමී රටක් උදෙසා ස්ථිරසාර ආර්ථික සංවර්ධනයක් සඳහා අඩිතාලම දැමීමටත් මේ සියල්ල එක හා සමානව වැදගත් වේ. එය වර්තමාන ශ්‍රී ලාංකික ජනතාවට පමණක් නොව ඔබේ දරු පරපුරට ද වැදගත් වේ. ඔබට අත් විඳීමට සිදු වූ බේදවාචකයන් ඔබේ දරුවන්ට ද අත් විඳීමට ඉඩ නොතැබිය යුතුය.

මාගේ දැනීම පරිදි සංහිඳියාව යනු මෙයයි. මෙය ඉතා ම සරළ දෙයක් වන අතර එය සියළු ශ්‍රී ලාංකිකයන්ගේ පොදු විශ්වාසය වන බව මාගේ හැඟීමයි. ඔබ එය ඉතා ම සංකීර්ණ හෝ ශ්‍රී ලාංකික සංස්කෘතියට පටහැනි වූ විදේශීය දෙයක් ලෙස සැලකිය යුතු නොවේ.

ඉහත දැක්වූ කුළුණු හතර අතර වගවීමේ යාන්ත්‍රණය හෝ අපරාධ නඩු පැවරීම දේශපාලනික වශයෙන් ඉතා ම සංවේදී ගැටළු ලෙස හඳුනා ගැනේ. මාගේ අදහස අනුව මෙය බොහෝ දුරට සිදු වන්නේ සාකච්ඡාවට භාජනය වන විශේෂ අධිකරණය, විනිශ්චය සභාව හෝ මණ්ඩලය මගින් සමස්ථ ජනගහනයෙන් කොටසකට, එනම් දමිළ ජනතාවට පමණක් ප්‍රතිලාභ හිමිවේ යැයි යන වැරදි අවබෝධය හේතුවෙනි. මෙය සිදු වී ඇත්තේ බොහෝ දෙනෙකු, විශේෂයෙන් බහුතර ප්‍රජාව මෙම යාන්ත්‍රණය දකින්නේ යුද සමයේ දී හමුදාව විසින් සිදු කරන ලද යුද අපරාධ සඳහා නඩු පැවරීමට ඇති විනිශ්චය සභාවක් ලෙස වන අතර එහිදී එල්.ටී.ටී.ඊ සාමාජිකයින් විසින් සිදු කරන ලද අපරාධ පිළිබඳ අවධානය යොමු නොකරන බව ඔවුන්ගේ හැඟීමයි. එහි ප්‍රතිඵලයක් ලෙස ඔවුන් වගවීමේ යාන්ත්‍රණය දකින්නේ ඔවුන්ගේ රණ විරුවන්හට දඬුවම් දීම ඉලක්ක කර ගත් ව්‍යුහාත්මක වශයෙන් ඒක පාක්ෂික හා ස්වභාවයෙන් ම අසාධාරණ විනිශ්චය සභාවක් ලෙසයි.

එය එසේ නොවන බව මාගේ හැඟීමයි. මන්ද යත් මෙම යාන්ත්‍රණය මගින්

බලාපොරොත්තු වන්නේ ජනතාවට දැඩි පීඩාවක් එල්ල කිරීම සම්බන්ධයෙන් වගකිව යුත්තන්ට එරෙහිව වාර්ගික හෝ ආගම් භේදයකින් තොරව නඩු පැවරීමත් එමගින් වින්දිතයන්ට, ඔවුන්ගේ පවුල්වලට හා ඔවුන්ගේ ප්‍රජාවන්ට යුක්තිය ඉෂ්ඨ කිරීමත්ය. අදාළ සිද්ධීන් තෝරා ගැනීමේදී උපයෝගී කරගත යුතු ප්‍රධාන නිර්ණායකය වන්නේ අපරාධයේ බැරෑරුම් බව වන අතර එය සිදු කළේ කවුරුන්ද යන වග නොවේ. නීතියේ ආධිපත්‍යය යන්නෙන් අදහස් වන්නේ සැබැවින් ම මෙය වන අතර මෙහි දී දේශපාලනයට ඉඩක් නොමැත. ඒ අනුව අධිකරණ යාන්ත්‍රණය සැලසුම් කිරීම, සැකසීම හා මෙහෙයවීම සිදු විය යුත්තේ ශ්‍රී ලංකාවේ සියළු ප්‍රජාවන්ට සාධාරණ හා එක සමාන ලෙස ප්‍රතිලාභ හිමි වන අයුරිනි. මෙම අධිකරණ යාන්ත්‍රණයේ දී අවධානය යොමු කෙරෙන අපරාධයේ ස්වභාවය ද්‍රව්‍යාත්මක හා කාලීන අධිකරණ බලය අනුව ඉතා ප්‍රවේසම්සහතතව සලකා බැලිය යුතුය. මන්ද යත් මෙම ක්‍රියාපරිපාටිය අධිකරණ යාන්ත්‍රණය සඳහා අවශ්‍ය පූර්ණ සහයෝගය හා ක්‍රියාකාරී සහභාගීත්වය තහවුරු කිරීම සඳහා මෙය ඉතා වැදගත් කරුණක් වන අතර එමගින් සැමට පිළිගත හැකි පරිදි යුක්තිය ඉටු කිරීම සඳහා තීරණාත්මක බලපෑමක් එල්ල කරන බැවිණි.

අධිකරණ යාන්ත්‍රණය යනු හමුදාව ඇතුළු ඇතැම් සංවිධානවල සාමූහික වගකීම පසුපස හඹා යාම සඳහා වන විනිශ්චය සභාවක් නොවන බව අවබෝධ කර ගැනීම ද වැදගත් වේ. ඒ තුළ වන්නේ අපරාධ පිළිබඳ පුද්ගලික වගකීම හඳුනා ගැනෙන ක්‍රියාපරිපාටීන් වන අතර එමගින් ඇතැම් පුද්ගලයන්ට එරෙහිව චෝදනා ගොණු කිරීමත් ඒ තුළින් ඔප්පු නොවූ චෝදනාවලින් වෙනත් පුද්ගලයන් නිදහස් කිරීමත් සිදු කෙරේ. එසේ ම නඩු පවරන ලද පුද්ගලයන්ට නීතියේ නිසි ක්‍රියාකාරීත්වය යටතේ තමන්ට එරෙහි චෝදනා අසත්‍ය බව ඔප්පු කිරීමටත් සාර්ථක ලෙස තම නිර්දෝෂීභාවය ඔප්පු කළ විට හෝ සාධාරණ සැකයකින් ඔබ්බට වැරදිකරුවකු බව ඔප්පු කිරීමට සාක්ෂි නොමැති විට චෝදනාවලින් නිදහස් වීමටත් අයිතියක් ඇත.

ජාත්‍යන්තර විනිසුරුවන්ගේ ගැටළුව කෙරෙහි වගවීමේ යාන්ත්‍රණය සම්බන්ධ සංවාදවල දී අවධානය යොමු වන බව පෙනී ගොස් ඇත. මාගේ අදහසට අනුව වඩා වැදගත් වන්නේ විනිසුරුවන්ගේ ජාතිකත්වය නොව, විනිසුරුවකු ලෙස කටයුතු කරන පුද්ගලයන්ට සෑම ප්‍රජාවකගේම සහයෝගය එක ලෙස ලැබේද යන්නත් ජනතාව තමන්ගේ නඩු ඔවුන්ගේ බුද්ධිය හා වෘත්තීය දක්ෂබව මත තීරණය වීමට ඉඩ හැරීමට කැමැත්තක් දක්වන්නේ ද යන්නත්ය. වඩා වැදගත් වන්නේ ඕනෑම නඩු විභාගයක් අර්ථාන්විත වීමට අවශ්‍ය සාධාරණ, දක්ෂ හා කාර්යක්ෂම විමර්ශන සිදු කිරීම සහතික කිරීමයි. ඉහළ ගුණාත්මකභාවයෙන් යුතු විමර්ශනවලින් තොරව ඉතා විශිෂ්ඨ විනිසුරුවන්ට පවා කළ හැකි දේ සීමිතය.

වේදනාකාරී හා සංකීර්ණ අපරාධ නඩු පැවරීමේ ක්‍රියාවලියක් ඔස්සේ කටයුතු කිරීමට වඩා පසුගිය දේ පිළිබඳ අමතක කර අනාගතය පිළිබඳ සිතීම වඩා යහපත් බව ඇතැමෙකුට තර්ක කළ හැකිය. කෙසේ වුවද, මා සිතන්නේ එවැනි ප්‍රවේශයක් මගින් විපාක නොලබා සිටීමේ සංස්කෘතියක් ඇති වීමට උපකාරීවනු ඇති බවත් එමගින් වින්දිතයන්හට යුක්තිය ඉටු කිරීමට නොහැකි වී අවසානයේ දී ඊට සමාන අපරාධ හා බේදවාචකයන් යළි ඇති වීමේ අවදානම වැඩි වනු ඇති බවත්ය. ස්ථාවර ප්‍රජාතන්ත්‍රවාදී රටක් ලෙස ශ්‍රී ලංකාව නීතියේ ආධිපත්‍යයට ගරු කළ යුතුය. එය සිදු කළ යුත්තේ නෛතික ලේඛනයන් මගින් පමණක් නොව ශක්තිමත් අධිකරණ ක්‍රියාමාර්ග තුළිනි.

අවසානයේ නීතියේ ආධිපත්‍යයට අනුව තම ජනතාව ආරක්ෂා කිරීමට රාජ්‍යයකට ඇති හැකියාව ජාතික රාජ්‍යයක අත්‍යවශ්‍ය යටිතළ ව්‍යුහයක්‌ වේ. අනෙකුත් සමාජීය යටිතළ පහසුකම් වන ජලය, සනීපාරක්ෂාව, අධ්‍යාපනය, ප්‍රවාහනය හා මූල්‍ය පද්ධතීන් හා සමානව ප්‍රතිපත්තිසහගත හා කාර්යක්ෂම අධිකරණයක් යනු ප්‍රජාතන්ත්‍රවාදී ජාතියක ප්‍රධාන අංගයකෙවේ. ශ්‍රී ලංකාවට ස්ථිරසාර ආර්ථික සංවර්ධනය හා සෞභාග්‍යය කරා පිය මැනීමට නම් නීතියේ ආධිපත්‍යය ස්ථාවරව හා නොවෙනස්ව යොදා ගැනීම අනිවාර්ය වේ.

ජපානය ශ්‍රී ලංකාවේ ඉතා පැරණි මිතුරෙකි. වසර හැත්තෑවකට පමණ පෙර යුද්ධයේ සාපයෙන් මිදුණු පසු රට යළි ගොඩනගමින් ජාත්‍යන්තර ප්‍රජාව අතරට යළි පැමිණීමට වෙර දරන අවස්ථාවේ ජපානයට මුලින් ම සහාය දුන් රටවල් අතරින් එකක් වූයේ ශ්‍රී ලංකාවයි. ශ්‍රී ලංකාව පසුගිය බේදවාචකයන්ගෙන් මිදී ඉදිරියට පිය මැනීමට අදිටන් කර සිටින මේ මොහොතේ ජපන් පුරවැසියෙකු ලෙස මෙම අප්‍රතිහත ප්‍රයත්නයට උර දෙන්නට ලැබීම මට මහත් ගෞරවයක් හා සතුටක් වේ. ස්තූතියි, මාගේ සහෘදයෙනි.

---

i A Prosecutor at the Supreme Prosecutors Office of Japan; Chair of the Board of Directors, the Trust Fund for Victims, International Criminal Court; Former United Nations International Judge at the Cambodia Khmer Rouge Trials, the Supreme Court Chamber; Former Professor of UNAFEI (United Nations Asia and Far East Institute for the Prevention of Crime and Treatment of Offenders), Former Visiting Professor of the University of Tokyo; Former Counsel, Office of the General Counsel, Asian Development Bank.